# බස්නාහිර පළාත් සමාජ සේවා දෙපාර්තුමේන්තුවේ සමාජ සේවා නිලධාරි II ශ්‍රේණියේ තනතුරට (සීමිත) බඳවා ගැනීම -2017

බස්නාහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සමාජ සේවා නිලධාරි 11 ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් සේවය ස්ථිර කර ඇති බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02.** 2.1 මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රා.ප.ච 03/2016 අනුව රු.34,605-10x660-11x755-15x930-රු.63,460/-වේ.(MN 5-2016 )වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II හි සඳහන් පරිදි ගෙවීම් සිදු කරනු ලැබේ.

2.2 අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2017.04.21 දින වේ.අයදුම්කරන තනතුරට අදාල සියලු සුදුසුකම් 2017.04.21 දින හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුයි.

**03.** **පොදු සුදුසුකම්**

අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ආ) සෑම අයදුම්කරුවෙක්ම බස්නාහිර පළාත තුල ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරෙහි රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

ඇ) වයස් සීමාව වයස අවු.21 ට නොඅඩු විය යුතුය.(දැනට පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

**04.** **සේවා කොන්දේසි**

මෙම තනතුර ස්ථිරය. අනුමත බඳවා ගැනීමේ පරිපාටිය සහ රජය විසින් පනවනු ලබන සේවා කොන්දේසි වලට යටත් වේ.

**05.** **<u>සුදුසුකම්</u>**

5.1 **අධ්‍යාපන සුදුසුකම් -**

5.1.1 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව,අපරාධ විද්‍යාව,සමාජ වැඩ,මනෝ විද්‍යාව,මානව විද්‍යාව,ආර්ථික විද්‍යාව,සමාජ අධ්‍යනය,සමාජ සංඛ්‍යානය, සංවර්ධන අධ්‍යාපනය,ජනගහන විද්‍යාව,සාමය හා ගැටුම් නිරාකාරණය යන විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයයක්ද ඇතුලත්ව සාමාන්‍ය/විශේෂ උපාධියක් ලබා තිබීම.

5.2 **පළපුරුද්ද-**

5.2.1 බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තනතුරක අවම වශයෙන් වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් තිබිය යුතු අතර තනතුරේ ස්ථිර කරන ලද නිලධාරියෙකු විය යුතුය.

5.3 **වෙනත් -**

5.3.1 පූර්වාසන්න වසර 5 ක කාලසීමාව තුළ විනය ක්‍රියා මාර්ගයකට ලක් නොවී සිටිය යුතුය.

06. **බඳවා ගැනීම් ක්‍රමය**

ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාවයේ අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. මෙම තරඟ විභාගය විෂයයන් 02 කින් සමන්විත ප්‍රශ්න පත්‍ර 02 කින් යුක්ත වන අතර සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයකට අවම වශයෙන් ලකුණු 50%ක් ලබා ගත යුතු වේ.

**6.1.** **ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය -**

**1.<u>අභියෝග්‍යතාවය හා බුද්ධි පරීක්ෂණය</u>** කාලය පැය 01 යි ලකුණු 100

අපේක්ෂකයාගේ භාෂා හැකියාව , තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව පරික්ෂා කිරීම සඳහා සකස් කරන ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

**<u>2.සාමාන්‍ය දැනීම</u>** - කාලය පැය 02 යි ලකුණු 100

ආර්ථික, දේශපාලන, අධ්‍යාපන, සංස්කෘතික, විද්‍යාත්මක, ක්‍රීඩා ක්ෂේත්‍රයන්හි දේශීය හා විදේශීය වශයෙන් වැදගත් වන්නාවූ කාලීන සිදුවීම් පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනීම පරික්ෂා කිරීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්න වලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

**07.** **විභාග ගාස්තු**

7.1 විභාග ගාස්තුව රු 400/- කි. මෙම විභාග ගාස්තුව බස්නාහිර පළාත තුල පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට බස්නාහිර පළාත් ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන ලෙස මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම් පත්‍රයට නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

**08.** **ඉල්ලුම් කළ යුතු පිළිවෙල**

8.1 මෙම නිවේදනයේ අග ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව ඒ 4 ප්‍රමාණයේ (සෙ.මී.21 x 29) කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කර ගත යුතුය.සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2017**.04.21 දිනට පෙර තම ආයතන ප්‍රධානියා,දෙපාර්තමේන්තු ප්‍රධානියා,අමාත්‍යාංශ ලේකම් හා ප්‍රධාන ලේකම් (බ.ප) මගින් ඔවුන්ගේ නිර්දේශ සහිතව එවිය යුතුය.නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා නොමැති හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.අයදුම්පත ලැබුණු බව දන්වනු නොලැබේ.

**09.** මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාල කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

එම්.ජී.ඒ තිලකරත්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත
2017.03.20